නමෝතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!

අපේ කතාබහ පිළිබඳව, කතාව පැවතිය යුත්තේ කෙසේද යන්න පිළිබඳව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශේෂයෙන්ම සඳහන් කොට තිබෙනවා. ආර්‍ය මාර්ගයේ දෙවෙනි පියවර ලෙසින් "සම්මා වාචා" යනුවෙන් හැඳින්වෙන එය බොරු බසින්, කේලාමින්, රළු වචනයෙන් සහ හිස් වචනයෙන් වැලකීම අදහස් කෙරෙන අතර එමඟින් යහපත් වචන භාවිතයට හුරු කරවා පුද්ගල අභිවෘද්ධියකට මෙන්ම සමාජ යහපතට ද යොමු කොට තියෙනවා.

කතා කළ හැකි නිසාම බොහෝ අය "යහපත් කථනය" තමන් දන්නා බවක් සිතනවා. එය නිවැරදි නැහැ. ඔබ අද කිසියම් ක්ෂේත්‍රයක දක්ෂයකු වී සිටිනවා නම් එසේ වීමට හේතුව ඔබ ඒ පිළිබඳව කළ ප්‍රගුණ කිරීමයි. එම නිසා එවන් නිපුණතාවක් පරිද්දෙන්, යහපත් කථනය ද නිපුණ කළ යුතුය.

නිදසුනක් ලෙස රාත්‍රියේ නින්දට යන ඔබ සමහර විටක ඔබේ පවුලේ සාමාජිකයෙක් රූපවාහිනී යන්ත්‍රය නරඹමින්, එහෙමත් නැත්නම් ගුවන් විදුලි යන්ත්‍රය ශ්‍රවණය කරමින් සිටිනු දැක කේන්ති ගෙන, "ඔය ටී.වී එක වහනවා", නැතිනම් "ඔය රේඩියෝ එක වහනවා" හෝ ඒ සමාන නියෝගයක් නිකුත් කරයි. සමහර විටක එසේ නරඹමින් හෝ ශ්‍රවණය කරමින් සිටි වැඩ සටහන එකී පුද්ගලයාට ප්‍රයෝජනවත් වැඩසටහනක් විය හැකියි. නමුත් ඔබ, ඔබ ගැන පමණක් සිතා කේන්ති ගත්තා නොවේද? කේන්තිය, එහෙමත් නැත්නම් තරහා පැමිණි විට එතැන යහපත් වචනයට ඉඩක් නැහැ. ඉහත අවස්ථාවේ කේන්ති නොගෙන "දැන් රෑ වුණානෙ, ටී.වී එක වහමු නේද?", "රේඩියෝ එක වැහුවොත් හොඳයි නේද? " වැනි යෝජනාවක් කළා නම් ඉන් ඇති විය හැකි සුබවාදී ප්‍රතිචාරය කොතරම් ද? එය ඔබට මෙන්ම අසන්නාටත් ලොකු නිවීමක් නේද? ඒ නිසයි මම ඔබට කියා සිටින්නේ යහපත් කථනය ඉගෙන ගත යුත්තක් බව.

වචන පිට කිරීමට පෙර අප කියන්න යන දෙය පිළිබඳව මොහොතක් සාවධාන විය හැකි නම් එය බොහෝ වැඩදායකයි. මන්ද, මුවින් පිට වූ දෙයක් අයහපතකට හේතු වුවහොත් එය නැවත නිවැරදි කිරීම ඉතාමත් දුෂ්කරයි.

සිතුවිලි සහ මනෝභාවයන් කතාවෙන් අනාවරණය වන නිසා කතාවේදී සිතුවිලි පමණක් නොව මනෝභාවයන් ගැන ද පරීක්ෂාකාරී විය යුතුය. නමුත් අද අප ගත කරන අව්වේකී, කලබලකාරී පරිසරය තුළ එවන් යහපත් වදනකට ඉඩක් ඇද්දැයි ඔබට විමසිය හැකියි. කලබලය නිසාම නොසැළකිල්ලෙන් භාවිතා කළ වදන් නිසාම සිදු වූ අලාභ, ඇති වූ මානසික වධබන්ධනයන් ගැන මෙනෙහි වන විට "ඇත්තෙන්ම මම තව ටිකක් ඉවසුවා නම් හොඳයි ", එහෙමත් නැත්නම් "ඒ වෙලාවෙ මම එහෙම නොකිව්ව නම් හොඳයි " වැනි සිතුවිල්ලක් ඇති වුණා නේද? ඒ කියන්නේ ඉවසිල්ලෙන් සිතා මතා කතා බහේ යෙදීම විපුල ඵලදායක බවයි.

යහපත් කතාබහ ඔබේ දිවියට ආශීර්වාදයක් වේවා!!

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි!!

ශාස්ත්‍රපති පූජ්‍ය රත්මලේ
පුඤ්ඤරතන හිමි
ජර්මනිය
www.karuna-samadhi.de

මුදලිතුමා

දිනක් එක් ධනවත් මුදලිතුමෙක් සිය සැප පහසු අස් රියෙන් ගමනක් යමින් සිටියා. ඔහු සිටියේ ඉතා මනරම් උද්‍යානයක් පසු කරමින්. හදිසියේම ඔහු දුටුවා උද්‍යානයේ ගසක් යට වාඩිවී සිටි මිනිසෙක්. ඔහු රියකරුගෙන් ඒ මිනිසා කවරෙකුදැයි විමසුවා.

"ඒ මේ පළාතේ ඉන්න දක්ෂම ජනප්‍රියම කවියා. මිනිස්සු ඔහුගේ කවි අහන්නේ වශී වෙලා වගේ. ඔහුට සම කරන්න කෙනෙක් මේ පළාතේම නැහැ." රියකරු පිළිතුරු දුන්නා.

මුදලිතුමාට සියුම් ඊර්ෂ්‍යාවක් ඇති උනා කවියා ගැන. යමින් සිටි ගමන මදකට පමා කර ඔහු රියෙන් බැස කවියා සිටි තැනට ගියා. කවියා නිහඬවම ඈත අහස දෙස බලා සිටියා මිස වචනයක් වත් දෙඩුවේ නැහැ. මුදලිද තමන්ගේ කවිකාරකම පෙන්වන්න සිතා ගත්තා.

"ඔහෝ කෙතරම් සුන්දර උදෑසනක් ද? කවි ලියන්න නම් කියාපු දවස. හැමදවසක්ම මෙහෙම නම්....! ". කවියා මදක් සිනාසී නිහඬවම සිටියා.

"බලන්න මේ නිල් අහස දෙස...හරියට හරියට...ඔව් මහ මුහුද වගේ නිල් පාටයි ". මුදලි තමන්ට පෙනෙන පෙනෙන දේ වර්ණනා කරන්න පටන් ගත්තා. "බලන්න මේ මල්. අතු අග පිපිලා තියෙන හැටි. මට කවි සීයක් උනත් ලියන්න පුලුවන්". කවියා සුපුරුදු නිහඬතාවෙන්ම සිටියා.

"ඕ... කුරුල්ලන් මිහිරි හඬින් ගී ගයනවා. මට පුලුවන් දවසක් උනත්..... නැහැ නැහැ.. සතියක්..... ඕනැනම් ඊටත් වැඩි කාලයක් අහගෙන ඉන්න. බලන්න හිරු රැස් පොළවට වැටෙන හැටි. හරියට...හරියට...ආ ඔව් මගේ මැදුරේ සුවිශාල පහන් වල එළිය වගේ... රාත්‍රියටත් මෙතන ලස්සනට ඇති. නේද උන්නැහේ? අහසේ තරු පිරිලා... හරියට...හරියට මගේ භාණ්ඩාගාරයේ තියෙන රන් කාසි හැමතැනම වැටිල වගේ.. අන්න ඒ වගේ ඇති. කවි ලියන්න පුලුවන් ඇති තරම්. එහෙම නේද? මගේ කවි පොත පිරෙන්න කවි ලියන්න පුලුවන් අදනම් මට. ඈත් කෙතරම් අපූරුද අද?"

කවියා මුදලි දෙස බලා හිනැහුනා මිස වචනයක් වත් දෙඩුවේ නැහැ. මුදලිගේ හිතට හරි නැහැ. තමන් මෙච්චර ලස්සනට පරිසරය වර්ණනා කරමින් සිය කවිකාරකම පෙන්වද්දිත් කවියා නිහඬවම සිටීම ගැන.

"මහ මූසලයෙක්..ගල් බීරෙක්.. කියන තරම් දක්ෂයෙක් නෙවෙයි වගේ." මුදලි එසේ සිතමින් ගොස් රියට නැගී සිය ගමන පිටත් වුනා. කවියා පත් ඉරු කිහිපයක් ගෙන එවායේ තම කවි ලියන්නට වුනා.[1]

මුදලිට, මුදලාලිට, සක්විතිට, සක්විති රජුනට තම භාණ්ඩාගාරයේ ඇති සියළු රන් රුවන් මුතු මැණික් වියදම් කිරීමෙන් හෝ අත් පත් කර ගත නොහැකි කවියා අත්විඳින මේ අපූර්ව නිමේෂය කුමක්ද? චතුරංගනී සේනාව රැගෙන විත් වට කොට පහර දීමෙන් හෝ කුරුබිලියෙන් රිංගා ගොස් අල්ලස් දීමෙන් හෝ විවර කරවා ගත නොහැකි මේ ද්වාරය කුමක්ද? විජයොත් රථ, විසල් මැඳුරු, රති සුව, කිත් යසස් හෝ පෙන්වා තොරොම්බල් කිරීමෙන් ඩැහැගත නොහැකි, කවියෙකුට සැබෑ මිනිසෙකුට පමණක් හිමි මේ අපූර්ව "දෙය" කුමක් ද?

(කවියා දිගටම ලියයි.)

මව් පොළොව කොයිතරම් පියකරුද යාළුවේ
හැම කුසගිනි සෘතුවේ
කුරුල්ලන් සේ අප ඉගිල ගිය සමයේ
සුන්දර නටබුන් ය ශේෂ වී තිබෙන්නේ
මගේ සිතුවිලි මතක අහසේ....[2]

කවි ලියැවෙන බිමෙන් උගුල්ලා, කොණ්ඩය ජෙල් කොටැ, සම විලවුන් ගල්වා, මූණ ද ජේෂල් කොටැ, කිරි සුදු ජාතික ඇඳුමකට බස්සවා ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයකින් පුදා අතට මල් වට්ටියක් දී කැමරා කණ්ඩායමක් සමග පන්සල් යැවීමෙන් ඩැහැ ගත නොහැකි සැබෑ මිනිසුන්ගෙ ' ආත්මය කුමක්ද? ස්වර්ගයේ ගේට්ටුවේ මුර පදය නොහොත් පවුල් පිටින් දඬු මොණරයකින් ඉගිල ගොස් ස්වප්න දේශයක ලැන්ඩ් කිරීමේ වරදානය බන්දේසියක තබා පිළිගැන්වීමෙන් හෝ උදුරා ගත නොහැකි මේ අපූර්වත්වය කුමක් ද?

(මේ අතර කවියා දිගටම කවි ලියයි.)

හු ගත වී ඇතත් මගේ නිදහස
කණගාටුවක් නෑ හදවතේ
පොළොව මතුපිට සරන මිතුරනේ
ලොවම පිබිදෙන දවස ආ විගස
නැවත හමුවෙමු ඉතින් පෙර ලෙසේ

නොපනත් ලොවට මා නොපෙනේ
එහෙත් මුළු ලෝකයම මට පෙනේ.....
මම දැන් සැඟවී සිටින්නෙමි
එහෙත් හැම අතම සැරිසරන්නෙමි
හිරු මඬල සේ
මගේ හදවත ඉතා උණුසුම්ය....
පොස්පරස් අංශුවක් වාගේ ම
මගේ හදවත දිලෙයි මා තුළම....[2]

වාරණයේ නිවට මාර්ග බාධක හරස් කොටැ, කලා පොලිසිවල ඇම්බැට්ට සුනඛයන් උසි ගන්වා, වාසල කේට්ටියන් ලවුවා පශු වදන් ලියවා නින්දා කොටැ, සකලවිධ සම්බාධක පැනවීමෙනුත් පසු හරවාලිය නොහැකි මේ වෙසෙස් බලය කුමක්ද? සංස්ථාපිත සියළු පීඩක යාන්ත්‍රණ යොදා අවසන නම්මවා ගත නොහුණු තැන, හතරවෙනි තට්ටුවේදී අණ්ඩ කෝෂ ලාච්චුගත කිරීමෙන් ද, ව්‍යාජ නඩු පටලවා කර ඇඹීමට තැත් කිරීමෙන් ද මේච්චල් කොට ගත නොහැකි මේ මුරණ්ඩුකම කුමක් ද? සුරාවෙන් ද මසවුලෙන් ද සතප්පවා බෝඩ් ලැලි අතට දී සටන් පාඨ කට පාඩම් කරවා වට රවුම් ළඟට යැවූ උද්ඝෝෂක කණ්ඩායම් හෙවත් ඊනියා මහජනතාවගේ බිරුසන් හඬ තඹ සත පහකට මායිම් නොකරන මේ ඇට්ටරකම කුමක්ද?

(කවියා දිගටම ලියයි.)

කුරුල්ලෙකු සිහිනෙනුත් දකින්නේ
ඈත නිල් අහසේ නිදහසේ
පියාපත් සලන්නයි
හැම දෙයම හදවතින් දකින්නයි...
ඒත්...
මගේ තටු පත් අතර
අහිරහස් ඝන යකඩ විලංගු ය
ඉඳින් මට පෙර විලස
පියාඹා යනු බැරිය....
මා මිනිසුන් අතර සඟවමින්
අතේ මේ කළු අහස
මටත් බිය වූවාය....

කෙසේ වටහා දෙමි ද මිතුරනේ
නිරුවත් සීත ඟන අඳුර තුළ
අසිරිය
හැමතැනම මරණයේ සීතලය
ඒත් මේ හැම දේම සුන්දරය
ජීවයේ පත්තරය
තනිරකින මිතුරන්ය
හු ගත ගරිල්ලෙක් සිටී නම්
-උ[3]....
වේස ගැනියකගේ පුතෙක් නම්,
ලොව ඇති උත්තම ප්‍රේමය ද
ලොව ඇති දරුණුතම වෛරය ද
තිබෙන්නේ ඒ රහස් හදවතේය
මිනී මස් බුදින දඩ වැද්දන්ට
ඒ දෑස්... ඒ දෑත්... ඒ හඬ ද
සිහිනෙනුත් මරණ බිය ළඟාකර වන්නේය....[2]

කුණු කාණුවල දමා පහර දීමෙන්, ගෙවල් වටා කම්බි වැටවල බැඳීමෙන්, කටවල් කැපීමෙන්, අදිසි පිටසක්වල ජීවී ප්‍රහාර සැලසුම් කොට ඉස්පිරිතාල ගැන්වීමෙන්, අතුරු දහන් කරවීමෙන් යට ගැසිය නොහැකි, දියෙහි

මේ අපූර්වත්වය කුමක් ද?

"ඕ... කුරුල්ලන් මිහිරි හඬින් ගී ගයනවා. මට පුලුවන් දවසක් උනත්..... නැහැ නැහැ.. සතියක්..... ඕනැනම් ඊටත් වැඩි කාලයක් අහගෙන ඉන්න. බලන්න හිරු රැස් පොළවට වැටෙන හැටි. හරියට...හරියට...ආ ඔව් මගේ මැදුරේ සුවිශාල පහන් වල එළිය වගේ... රාත්‍රියටත් මෙතන ලස්සනට ඇති. නේද උන්නැහේ? අහසේ තරු පිරිලා... හරියට...හරියට මගේ භාණ්ඩාගාරයේ තියෙන රන් කාසි හැමතැනම වැටිල වගේ.. අන්න ඒ වගේ ඇති. කවි ලියන්න පුලුවන් ඇති තරම්. එහෙම නේද? මගේ කවි පොත පිරෙන්න කවි ලියන්න පුලුවන් අදනම් මට. ඈත් කෙතරම් අපූරුද අද?"

කවියා මුදලි දෙස බලා හිනැහුනා මිස වචනයක් වත් දෙඩුවේ නැහැ. මුදලිගේ හිතට හරි නැහැ. තමන් මෙච්චර ලස්සනට පරිසරය වර්ණනා කරමින් සිය කවිකාරකම පෙන්වද්දිත් කවියා නිහඬවම සිටීම ගැන.

එබූ රබර් බෝලයක් බඳුව නැවත ද නැවත ද මතුවෙන මේ පුදුම ගුණය කුමක් ද? මරා දැමීමෙන් කෙළවර කළ නොහැකි, දහසක් මිනිස් සිත් තුළ නැවත නැවතත් උත්ථානය වන මේ ආශ්චර්යමත්බව කුමක් ද?

තරංග ජයසේන
www.boondi.lk

1. අනුෂ්ක තිලකරත්න ලියූ "කවියා සහ මුදලිතුමා" කෙටි කතාවෙන් උපුටාගත් කොටසකි.
2. "හු ගත ජීවිතය" - චන්ද්‍ර කුමාර වික්‍රමරත්න (මේ අදින් වසර 16කට පෙර අප්‍රේලයේ දී චන්ද්‍ර කුමාර වික්‍රමරත්න නමින් මුද්‍රිත අකුරෙන් පළ වූ අවසන් කවි පෙළය. සර්යා 2008.03/04)